ජාතික ඔලිම්පික් කමිටුවට එරෙහිව ඇති චෝදනා බොරු

ඔලිම්පික් කමිටු සභාපති හේමසිරි ප්‍රනාදු

මාර්තු මාසයේ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙලට විශාල ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රමාණයක් සහභාගි කරවීමට ක්‍රීඩා අමාත්‍යාංශය හා ජාතික ඔලිම්පික් කමිටුව සූදානම්න් සිටී. පොදු රාජ්‍ය මණ්ඩලයීය තරගාවලිය සඳහා ශ්‍රී ලංකාවේ සූදානම හා ඒ පිළිබඳව ජාතික ඔලිම්පික් කමිටුවේ කාර්යභාරය පිළිබඳවත් සාග් ක්‍රීඩා උළෙල සම්බන්ධයෙන්ද අපි ඔලිම්පික් කමිටු සභාපති හේමසිරි ප්‍රනාදු මහතා මුණ ගැසුනෙමු.

මෙල්බර්න් නුවර පැවැත්වීමට යෝජිත පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙලට අපේ සූදානම ගැන මුලින්ම දැන ගන්න කැමතියි.

අපේ ක්‍රීඩක, ක්‍රීඩිකාවන් කණ්ඩායමක් ඒ සඳහා සහභාගි කරවන්න තීරණය කර තිබෙනවා. මේ දිනවල ඔවුන් අදාළ ක්‍රීඩා සංගම් මගින් තෝරාගෙන අප වෙත දැනුම් දී අවසන්. ඔවුන් අතරින් තරගාවලියට සහභාගි කරවන්නේ කවුද? කුමන ඉසව්වලට අපි සහභාගි වෙනවද කියන එක ඉදිරි දින කීපය තුළ ජාතික තේරීම් කමිටුව මගින් තෝරා ගන්න නියමිතයි. කොහොම වුවත් සැලකිය යුතු ක්‍රීඩක, ක්‍රීඩිකාවන් පිරිසක් මෙවර සංචාරයට සහභාගි කරවන්න අපට හැකිවේවි.

පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා ඉතිහාසයේ අපි පදක්කම් කීපයක් දිනාගෙන තිබෙනවා. මෙවර තරගාවලියේදී අපට එම තත්ත්වය රැකගන්න හැකි වේවිද?

එයට පිළිතුරු දීම මට අයිති කාර්යයක් නොවෙයි. එය තරගාවලියට සහභාගි වන එක් එක් ක්‍රීඩා සංගම්වලට පැවසිය හැක්කක්. මම දන්නේ නැහැ අපට ඇත්තටම පදක්කම් දිනා ගන්න පුළුවන්ද බැරිවේවි ද කියලා. නමුත් අපිට පදක්කම් දිනාගත හැකි මට්ටමේ ක්‍රීඩකයන් ඉන්නා බවක් මම විශ්වාස කරනවා. ජාතික තේරීම් කමිටුව තරගාවලියට ඉදිරිපත් කරන්නේ අවම වශයෙන් හෝ ඒ සඳහා සහභාගිවීමට කුසලතා ප්‍රදර්ශනය කළ ක්‍රීඩකයන් පමණයි.

සුසන්තිකා ජයසිංහ හට මෙවර පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙල අහිමි වෙලා තිබෙනවා. ඒ පිළිබඳව ඔබේ අදහස් දැනගන්න කැමතියි.

ඇත්තෙන්ම එය අදාළ ක්‍රීඩා සංගමය ගත් තීරණයක්. පසුගිය කාලයේ ඈ මලල ක්‍රීඩා තරගවලට සහභාගි වී දක්ෂතා පෙන්වා නැති නිසා තරගාවලියට නම් නොකල බවයි මලල ක්‍රීඩා සංගමය ප්‍රකාශ කරන්නේ. අදාළ පරිපාලන මට්ටමට ළඟා නොවුණු කිසිවෙක් සංචාරයට රැගෙන යන්න අපට හැකියාවක් නැහැ.

සාග් ක්‍රීඩා උළෙල අගෝස්තු මාසයේ ශ්‍රී ලංකාවේ පැවැත්වීමට යෝජිතයි. මේ සඳහා සූදානම මොනවගේද?

මම කලින් කලට මේ සඳහා සූදානම් විය යුතු ආකාරය ගැන දේශීය ක්‍රීඩා බලවතුන් දැනුවත් කළා. වර්තමානය වෙද්දී ඒ සඳහා පත්කර ඇති බොහෝ සංවිධාන කමිටු ක්‍රිවාත්මක වෙමින් තිබෙනවා. ක්‍රීඩා අමාත්‍යවරයාත් අවංකව තරගාවලිය සංවිධානය කරන්න කැපවෙලා සිටිනවා. ඒ වගේම නව ජනාධිපතිවරයා. එතුමාත් සාග් ක්‍රීඩා උළෙල සංවිධානය කරන්න අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය පූර්ණව ලබාදෙන්න එකඟ වී තිබෙනවා. ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයාත් ඒ සඳහා උනන්දුවෙන් ක්‍රියා කරන නිසා සාග් ක්‍රීඩා උළෙල පිළිබඳව එතරම් ප්‍රශ්නයක් නැති වේවි.

මෙයට පෙර සාග් ක්‍රීඩා උළෙල පවත්වන්න යෝජිත වෙලා තිබුණේ අප්‍රේල් මාසයේ. ඔබ ඔබගේ විනිශ්චයන් අනුව යමින් ක්‍රීඩා අමාත්‍යවරයා ඔබේ මතයට නම්මවා ගෙන තරගාවලිය කල් දැම්මාය කියන කතාව ඇත්තක්ද?

රටේ පැවැති දේශපාලනික තත්ත්වය, පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙල ආදිය පැවැත්වෙන දින වකවානු සලකා බලද්දී සාග් ක්‍රීඩා උළෙල කල් දමන්න සිදුවුණා. ඒ තත්ත්වය අවබෝධ කරගෙන මටත් ඔලිම්පික් කමිටුවක් ක්‍රීඩා අමාත්‍යවරයා ඇතුළු රජයේ බලධාරීන් දැනුවත් කළා. පවතින තත්ත්වය තේරුම් ගෙන ඔවුන් එයට එකඟ වුණා. මා කර තිබෙන්නේ පවතින ප්‍රායෝගික තත්ත්වය යටතේ ක්‍රීඩා කිරීමක් මිස වරදක් නොවේ.

ඔබ දේශීය ක්‍රීඩාවේ පරමාදර්ශය ලෙස පෙනී සිටින බවත් ක්‍රීඩාවේදී ඔබට ඉහළින් කපුටකුටවත් පියඹා යන්න බැරි තත්ත්වයක් ගොඩනගා ගෙන ඇති බවත්, ජාතික ඔලිම්පික් කමිටුවට නැවත පත්වීම එකී බලපරාක්‍රමයේ ප්‍රතිඵලයක් බවත් ඔබගේ විරුද්ධවාදීන් කරන ප්‍රකාශයන් ගැන මොකද කියන්නේ?

මා සත්‍යවාදීව, නිවැරදිව, මගේ සිතට එකඟව වැඩ කරනවා. මා ක්‍රීඩාවෙන් මුදල් ගසා කා නැහැ. වංචා කර නැහැ. මට මේ රටේ ඉතා හොඳින් ජීවත්වෙන්න තරම් ප්‍රමාණවත් මුදල් තිබෙනවා. ඔබ සැම දන්නවා මම අග්‍රාමාත්‍ය ලේකම් ධූරය පවා ප්‍රතිපත්තිමය හේතු මත අතහැර දැමුවා. ක්‍රීඩා පරිපාලනයේ සෘජු තීරණ ගන්නවා කියන එක ඒ නිසා මට ලොකු දෙයක් නොවෙයි. මම කොහොමත් හිතට එකඟව වැඩ කරන නිසා මෙවැනි චෝදනා එල්ල වේවි. නමුත් මම කවදාවත් වැරදි උපදෙස් ක්‍රීඩා අමාත්‍යවරයාට ලබා දී නැහැ. අනෙක ජාතික ඔලිම්පික් කමිටු සභාපතිත්වයට මා තෙවැනි වරට පත්වුණේ පවතින නීති රෙගුලාසි යටතේම මිස ඒවා උල්ලංඝණය කර නොවෙයි.

ඔබට ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ උප සභාපතිධූරයක් ලැබෙන්න යන බව පසුගිය කාලයේ කියැවුණා නේද?

ඔව්. ආසියාවේ සිටින ජ්‍යෙෂ්ඨතම ඔලිම්පික් කමිටු සභාපතිවරයකු වශයෙන් මා තමයි ජාත්‍යන්තර ඔලිම්පික් කමිටු උපසභාපතිධූරයට ළංවම සිටින්නේ. මේ අවස්ථා මෙවර ලබා නොගත්තොත් එය සෑහෙන කලකට යළි ශ්‍රී ලංකාවට ලැබෙන්නේ නැහැ. ඉතින් මා ඒ සඳහා උනන්දුවක් දක්වනවා. ඉදිරියේදී එය මට ලැබේවි. එය මගේ පුද්ගලික ජයග්‍රහණයක් නොව මේ රට ලබන ජයග්‍රහණයක් කියා කිව්විය යුතුයි.

ජාතික ඔලිම්පික් කමිටුවට එරෙහිවද මූල්‍ය දූෂණ චෝදනා එල්ල වී තිබුණා. ඇතැම් මාධ්‍ය ඒ ගැන නිරතුරුව වාර්තා කළා. ඒ ගැන ඔබ මොකද කියන්නේ.

ඒ සියල්ල බොරු චෝදනා. විගණකාධිපතිතුමා විසින් අධීක්ෂණය කර මෙම තත්ත්වය සනාථ කර තිබෙනවා. මා සෘජුව කියනවා, බැ හා හොරු නැති බව. අපි හැමවිටම මුදල් සම්බන්ධ කටයුතු වලදී ඉතා විනිවිද පෙනෙන ආකාරයේ සැලැස්මක් ක්‍රියාවට නැංවුවා. පසුගිය කාලයේ ජාතික ඔලිම්පික් කමිටු ගිණුමේ ඉතා විශාල මුදලක් තැන්පත් කරන්නත් අපට හැකිවෙලා තිබෙන්නේ මේ විධිමත් මූල්‍ය සැලසුම් නිසයි.

අවසන් වශයෙන් ඔබ ජාතික ඔලිම්පික් කමිටුවට ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකරන බව කාලයක තිස්සේ පවසනවා. වර්තමානයේ එහි තත්ත්වය මොනවගේද?

මම කියන්නේ කළ හැකි දේවල් හා කළ යුතු දේවල් පමණයි. ජාතික ඔලිම්පික් කමිටුවට නිවාස්නයක් ඉදිකිරීම, ගෘහස්ථ ක්‍රීඩාගාරයක් සහිතව ක්‍රීඩා සංගම්වල කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීමේ වැඩකටයුතු සියල්ල දැන් ආරම්භ කරන්න සූදානම්. ඒ සඳහා අවශ්‍ය මූලික වියදම් වලින් සැලකිය යුතු ප්‍රමාණයක් අපි සොයාගෙන ඉන්නවා. ඒ වගේම ඒ සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය රජය මගින් මූල්‍යමය ප්‍රතිපාදන ලබාදෙන්න එකඟ වී අවසන්. ඉදිකිරීම් කටයුතු මෙහෙයවීමට මා ඔලිම්පික් කමිටුවේ උපසභාපති වරයෙක් වන ඩයන් ගෝමස් මහතා පත්කර තිබෙනවා.

චමින්ද සමන් කුමාර